# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2233/28 - 2021 ජූනි මස 23 වැනි බදාදා - 2021.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාව - සංශෝධන අංක 05

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2015 අගෝස්තු මස 21 දිනැති අංක 1928/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍ර පළ කරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝගය පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 ජූනි මස 22 වැනි දින.

**I** කොටස :

සංශෝධන අංක 01 - 2016 මාර්තු 01 දින හා අංක 1956/16 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 02 - 2019 සැප්තැම්බර් 16 දින හා අංක 2141/6 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 03 - 2020 ජනවාරි 21 දින හා අංක 2159/11 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 04 - 2020 නොවැම්බර් 24 දින හා අංක 2203/8 *අති විශෙෂ ගැසට් පත්‍රය*

(I) සාරාංශය :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 1 විනාඩි 30 | ලකුණු 100, සමත් ලකුණ 40යි.<br>බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| 2. අවබෝධය | පැය 02 | ලකුණු 100, සමත් ලකුණ 40යි.<br>බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්න වලින් සමන්විත වේ. |

(II) විෂය නිර්දේශය :

| *බුද්ධි පරීක්ෂණය* |
|---|
| අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටලුවිසඳීමේ හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනාගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ. |
| අවබෝධය |
| අපේක්ෂකයා සතු කරුණු අවබෝධ කර ගැනීමේ හැකියාව, සන්නිවේදන කුසලතා, සාරාංශකරණය, විවරණය හා නිර්මාණාත්මක බව ආදී කුසලතා මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වේ. |

(ආ) රජයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන පොදු තරග විභාගයේ දෙවන කොටස (ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීමට අදාල විශේෂිත කොටස) :

(I) සාරාංශය :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය |
|---|---|---|
| සාමාන්‍ය දැනීම | පැය 01 | ලකුණු 100, සමත් ලකුණ 40යි. |
| විශ්ලේෂණාත්මක අධ්‍යයනය | පැය 01 විනාඩි 30 | ලකුණු 100, සමත් ලකුණ 40යි. |

(II) විෂය නිර්දේශය :

| *සාමාන්‍ය දැනීම* |
|---|
| අධ්‍යාපන ක්ෂේත්‍ර සම්බන්ධ එනම්, දේශීය අධ්‍යාපන ප්‍රතිපත්ති, නීති, නවීකරණ හා ප්‍රතිසංස්කරණ, දේශීය අධ්‍යාපනයේ ඉතිහාසය හා කාලීන තොරතුරු, අධ්‍යාපනයේ දේශීය හා ජාත්‍යන්තර ප්‍රවණතා ආදී ක්ෂේත්‍රයන් කෙරෙහි වැඩි නැඹුරුවක් සහිතව සහ දේශීය හා විදේශීය අධ්‍යාපනයේ කාලීන තොරතුරු එනම් විද්‍යාත්මක හා තාක්ෂණික, සමාජ-ආර්ථික, දේශපාලනික, භූගෝලීය, නෛතික, පාරිසරික, සංස්කෘතික, ක්‍රීඩා පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන බහුවරණ/ කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| *විශ්ලේෂණාත්මක අධ්‍යයනය* |
| අපේක්ෂකයා සතු විශ්ලේෂණ, සංස්ලේෂණ සහ නිර්මාණාත්මක හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන සිද්ධි අධ්‍යයනය ඇතුළත්ව, වගු හා ප්‍රස්තාර ආදිය ආශ්‍රයෙන් සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්න වලින් සමන්විත වේ. |

02. විභාග මාධ්‍යය :

I. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත්වේ.
II. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය.
III. අපේක්ෂකයින් මෙම විභාගයේ සියලු ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු අතර, ඒ සඳහා එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරා ගත යුතුය.
IV. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
V. විභාගය සඳහා පෙනී සිටින මාධ්‍යයම බඳවා ගැනීමේ මාධ්‍ය ද වේ.

07 - 53

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.